# අපූරු යාලුවෝ



ඒ.ජේ.එම්.ඔනිති සියන්සා අබේකෝන්

# අපූරු යාලුවෝ

ඒ.ජේ.එම්.ඔනිති සියන්සා අබේකෝන්

# අපූරු යාලුවෝ

ප්‍රථම මුද්‍රණය :- 2025

කතෘ :- ඒ.ජේ.එම්.ඔනිති සියන්සා අබේකෝන්

ලිපිනය:- 1/67
ඉහළ තැන්නේකුඹුර,
මහනුවර.

ISBN අංකය :- 978-624-208-400-8

මුද්‍රණය :-
"Lanka Offset Printers"
නො.223 ඩී.එස්. සේනානායක වීදිය,
මහනුවර.

# පිදුම

නිති දැනුම ලබා දී
මා යහමඟට යැවීමට
ඔවදන් දෙමින්, අකුරු කියාදෙන
ආදරණීය විදුහල්පතිතුමිය...
පන්තිභාර ගුරුතුමිය ඇතුළු
ගුරු මෑණිවරුන්ටත් පියවරුන්ටත්...

දිවා රෑ වෙහෙසෙමින් මා ඇති දැඩි කළ
මාගේ මෑණියන්ටත්, පියාණන්ටත්...
මා වැනිම දැනුම හඹා යමින් වෙහෙසෙන මාගේ ආදරණීය
සොහොයුරියන්ටත්

පුදමි මේ පොත සෙනෙහසින්...

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ. දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැණීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවට පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳරන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්නා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

---

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකමත් එක කැලයක අපූරු යාලුවෝ පස් දෙනෙක් ජීවත් උණා.ඒ යාළුවෝ පස් දෙනා අතර අලියෙක්, හාවෙක්, මුවෙක්, නරියෙක් සහ වඳුරෙක් හිටියා.



දිනක් මේ යාලුවෝ පස් දෙනා විනෝදයෙන් සෙල්ලම් කරමින් සිටියා.



මෙහෙම සෙල්ලම් කරමින් සිටින විට දඬයක්කාරයෙක්ගේ උගුලකට පුංචි හා පැංචා වැටුණා.



" අපෝයි! අනේ යාලුවනේ මාව බේරගන්නකෝ මාව වලකට වැටුණා. "
හා පැංචා බයෙන් කෑ ගැසුවා.



"ඉන්න ඉන්න හා පැංචෝ අපි මොනවාහරි කරන්නම් ඔයාව බේරගන්න"
අලි පැංචා කීවා.
" මේක නම් අර නපුරු දඩයක්කාරයෙක් ගේ වැඩක් තමා "
අලියා කේන්තියෙන් කිව්වා.



" හරි හරි දැන් හා පැංචාව බේරගන්න උපායක් හිතමුකෝ "
නරියා කිව්වා.
හතර දෙනාම එක්ව උපායක් කල්පනා කරන්නට වුණා. . .



" යාළුවනේ අපි මේ ගස් වල වැල් අරගෙන කඹයක් හදමු.
ඊට පස්සේ අපිට පුළුවන් කඹය වලට දාලා අපේ හා පැංචාව
ගොඩට ගන්න  මුවා කිව්වා.
"ෂා... කදිම අදහසක් නේ මුව හාමි ඒක" වඳුරා කිව්වා.



"අලි පැංචෝ් වඳුරු පැංචෝ් ඔයාලා දෙන්නට පුලුවන් නේද
අර ගස් වල වැල් ටිකක් කඩලා දෙන්න.
මටයි නරි හාමිටයි පුළුවනි ඒවා ගැට ගසන්න."
මුවා කිව්වා.



අලියා සහ වඳුරා එයට එකඟ වුණා. ඉන් පසු යාලුවෝ හතර දෙනා එකට එකතු වී කඹයක් සකස් කලා.



ඉන් පසු හාවා වැටී සිටින වළ ලගට ගොස් නරියා මෙසේ කිව්වා.
"හාවෝ අපි දැන් ඔයාව බේරගන්නයි යන්නේ, ඔයාට අපි කඹයක් දාන්නම් ඒක හයියෙන් අල්ලගන්න ඕනේ හරිද ඊට පස්සෙ අපි ඔයාව උඩට ගන්නම්" කියලා නරියා කිව්වා.



හාවා නරියා කියූ විදිහටම කඹය තදින් අල්ලා ගත්තා.
ඉන්පසු අලියා කඹය ඇද හාවාව එලියට ගත්තා.එලියට ආපු හාවා සතුටෙන් කෑ ගැසුවා..
" හුරේ... හුරේ... "



බොහොම ස්තූතියි මගේ යාලුවන්ට මාව බේරගත්තට... "
හාවා යාලුවෝ හතර දෙනාටම ස්තූති කරා...

ඉන් පසු සියලු දෙනාම සතුටින් නිවෙස් බලා විසිර ගියා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මානකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එලිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමුලික පරෙය්ෂණ ව්‍යාපෘතිය යටතෙ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැක.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂනය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්
2025 . 02 . 08

9 786242 084008